# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2566
නවම් මස 05 වන ඉරිදා



# බෞද්ධාලෝකය

## ධර්ම සන්නිවේදනය සහ ග්‍රාහකයා

යම් ධර්ම කරුණක් තම ධර්ම ග්‍රාහකයා නිවැරදිව අවබෝධ කරගත්තාද ? නැතිද? යත්ත දැකගත හැකිවන්නේ ධර්ම ග්‍රාහකයා දක්වන ප්‍රතිචාරයන්ගේ ස්වභාවය අනුවය. ධර්ම පණිවිඩය එම ග්‍රාහක මනසට පිවිස නැත්නම්, පණිවිඩය ග්‍රහණය වී නොමැති නම් ඒ සඳහා අවශ්‍ය ඊළඟ සුදුසු පියවරක් ගැනීමට ධර්ම සන්නිවේදකයාට හැකියාව ඇත. මාධ්‍ය හෝ ක්‍රම සහ විධි වෙනස් කරමින් හෝ පණිවිඩයේ ආකෘතිය වෙනස් කරමින් හෝ අන්තර්ගතය ලිහිල් කරමින්, සරල කරමින් ප්‍රතිසන්නිවේදනයකට හෝ සැඟීමකට පත්විය හැකි අයුරින් ග්‍රහණය වී ඇත්නම් එතනින් එහාට ගත යුතු පියවර තීරණය කිරීමට ධර්ම සන්නිවේදකයාට අතිශයින්ම වැදගත් වන්නේ ග්‍රාහක ප්‍රතිචාරයන්මය.

ධර්ම සන්නිවේදකයා ධර්ම පණිවිඩයක් ධර්ම ග්‍රාහකයා වෙතට සන්නිවේදනය කිරීමෙන් අනතුරුව එම ධර්ම ග්‍රාහකයාගේ මනසේ ග්‍රහණය විදැයි දැන ගත හැකි වන්නේත්, ඒ කෙබඳු තත්වයකින්දැයි හරි හැටි හඳුනාගත හැකි වන්නේත් එබඳු ප්‍රතිචාර වලින් පමණි. ධර්ම සන්නිවේදකයා එබඳු ප්‍රතිචාර දෙස විමසා බලා තම ධර්ම පණිවිඩය සන්නිවේදනය කෙරුණු අයුරු වටහා ගැනීම ප්‍රතිපෝෂණය නම් වෙයි. ධර්ම සන්නිවේදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට ඉවහල් වනුයේ මේ ප්‍රතිචාර හා එයින් ලබන ප්‍රතිපෝෂණයයි.

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය

මෙරට බෞද්ධ ජනතාවට, රට පුරා වෙහෙර විහාරස්ථානවල බෞද්ධ ස්වාමීන් වහන්සේලාට වර්තමානයේ විවිධ ගැටළුවලට මුහුණ පෑමට සිදුව තිබේ. මෙම ගැටළු විසඳීමට අදාල අංශවල අවධානය යොමු කරවීම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වගකීමක් ලෙස සලකමු.

රටපුරා, බෞද්ධ ජනතාවගෙන් ස්වාමීන් වහන්සේලාගෙන් මෙන්ම බෞද්ධ සමිති සමාගම්වලින් ලැබෙන පැමිණිලි සහ අදහස් ඒකරාශී කර අදාල ආයතන වලට යොමු කර එම ගැටළු වලට විසඳුම් ලබා දීමේ අරමුණින් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත.

buddhistinfo380@gmail.com

යන විද්‍යුත් ලිපිනයන් ඔස්සේ සහ

බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

380, බෞද්ධාලෝක මාවත,

කොළඹ 07 යන ලිපිනයට අදාල තොරතුරු යොමු කළ හැකිය.

බෞද්ධාලෝකය

**උපදේශක මණ්ඩලය**
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**සංස්කරන කළමණාකරනය**
ඉෂාන් බුද්ධික එදිරිසූරිය

**සංස්කාරක මණ්ඩලය**
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

**පිටු සැකැස්ම**
කාවින්ද දිල්ෂාන්
ත්‍රිෂාන්ති දිසානායක

**ප්‍රකාශනය**
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය ( 011 2691659 / 011 2665047)
ෆැක්ස් (011 2665047)
web : www.acbc.lk
E-mail : buddhistinfo380@gmail.com



# නවම් පොහොයේ වැදගත්කම



බෞද්ධ ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිදුවීම් රැසක් නවම් පෝදා සිදුවිණ. සැරියුත් - මුගලන් මහ රහතන් වහන්සේ සම්බුදු සසුනේ අග සවු තනතුරු ලැබුවේ, නවම් පොහෝ දිනයේදීය.

ප්‍රථම මහා සංඝ සන්නිපාතය (*Frist ongregation*) පැවැත්වූයේද නවම් පොහෝ දිනයේදීය.

බුද්ධ ශාසනයේ අග සවු සැරියුත් මුගලන් දෙනම, එකී සම්භාවනීය තනතුරු වලට පත්වීමද, නවම් පොහෝ දිනයකදී සිදු විය.

තථාගත බුදුපියාණන් වහන්සේ, සංඝරත්නයට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කොට වදාළේත් නවම් පොහෝ දිනයකදීය.

බුදුන් වහන්සේ පිරිනිවන් පාන්නට මාස තුනකට පෙර ආයු සංස්කාරය සිදු කළේත්, නවම් පෝය දිනකදීය.

මෙවන් වැදගත් සිදුවීම් නවම් පෝය දිනයේදී සිදුවීම නිසා, ඒවා අනුස්මරණය කරමින් බොදු සිරිතට අනුව තම ජීවිත සකස්කර ගන්නට කිසියම් උත්සාහයක් දැරීමට, බොදු සැදැහැතියන් නවම් පෝය දිනයේදී අදිටන් කරගන්නවාට සැකයක් නොමැත. සිරිලක වෙහෙර විහාර බැතිමතුන්ගෙන් පිරී ඉතිරී යන දිනයකි, නවම් පෝය දිනය. දාන-ශීල-භාවනා-ආදී වටිනා කාර්යයන්හි යෙදෙන බෞද්ධ බැතිමතුන්ගේ එකම අදිටන මුළු මිනින් බෞද්ධ ප්‍රතිපත්තිවලට මෙදින මුල්තැන දීමයි.

නවම් පොහෝදිනයේදී ශාසනික සිදුවීම් සිදුවූ වැදගත් ස්ථාන අතරින් රජගහ නුවර වේළුවනාරාමය ප්‍රධාන ය. එයට හේතුව ප්‍රථම මහා සංඝ සන්නිපාතය එහි පැවැත්වීමයි. උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන තුන් බෑ ජටිල භික්ෂූන් ප්‍රධාන දහසක් භික්ෂූන්ද, සැරියුත්, මුගලන් දෙනම මෙම ප්‍රථම මහා සංඝ සන්නිපාතයට සහභාගිවූහ.

එක්දහස් දෙසිය පනහක් මහා රහතන් වහන්සේ මැද වැඩ සිටි තථාගත බුදු පියාණන් වහන්සේ ධර්ම සේනාධිපති සාරිපුත්ත හා මහාර්ධිලාභී මුගලන් දෙනම පිළිවෙලින් දකුණත් සවු සහ වමත්සවු තනතුරුවලට පත්කරන ලදී.

සංඝ ශාසනයේ ජ්‍යෙෂ්ඨ හිමිවරු කීප නමක්ම සිටියදී , ජ්‍යෙෂ්ඨත්වයක් නැති සැරියුත්-මුගලන් දෙනමට අග්‍ර ශ්‍රාවක තනතුරු ලබාදීම පිළිබඳ භික්ෂූන් අතර විවිධ කතා ඇති විය. බුදු දහමේ වැදගත් ප්‍රජාතන්ත්‍රවාද ලක්ෂණයක් නම්, කිසියම් සැකයක් ඇතිවූ විටත් ඒ ගැන ප්‍රශ්න කරන්නට ඇති අයිතියයි. බුදුන් වහන්සේ කරුනු පැහැදිලි කරමින් දෙසා වදාළේ.

මහණෙනි, පංචවාර්ගික භික්ෂුහු, යස භික්ෂුව, භද්‍ර වර්ගික භික්ෂුහු තුන් බෑ ජටිල යන හැමදෙනාම විවිධ ප්‍රාර්ථනා සහිතව පින් කළහ. අග සවු පදවි පතමින් පින් කළ දෙදෙනා වූයේ සැරියුත් - මුගලන් දෙනමයි. එමනිසා ඒ දෙනම එකී තනතුරුවලට පත් කළ වග බුදුන්වහන්සේ පැහැදිලි කර දුන් සේක.

සැරියුත් හිමියන් බමුණු මහ සල් කුලයෙහි උපන්නේ මෙයට අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙරය. එදා ඔහු 'සර්දා' නම් විය.

මුගලන් හිමියන් ද උපන්නේ මහසල් කුලයේ ය. හේ නමින් සිරිවඩ්ඩ නම් විය.

මේ දෙදෙනා අඹ යහළුවෝ වූහ. සර්දා, තම පියාගේ ඇවෑමෙන් ලද ධනය දුගී, මගී, යාචකයන්ට බෙදා දෙමින් මෝක්ෂය සොයා යමින් පැවිදි විය.

එදවස අනෝමදස්සි නමින් බුදු කෙනෙක් පහළ වූහ. උන්වහන්සේගේ අග සව්වන් වූයේ නිසග සහ අනෝම ය. අනෝමදස්සි බුදුන් වහන්සේ සාරද තවුසන් හමුවන්නට වැඩම කළහ. උන්වහන්සේ දහම් දෙසුමට සවන් දුන්නද රහස් ඵලයට පත්නොවිණ. එයට හේතුව, සාරද අනාගතයේ බුදුබව ලබන ගෞතම බුදුන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක තනතුර ප්‍රාර්ථනා කළ බැවින්ය.

ගෞතම බුදුරදුන් පහළ වූ කල මුගලන් තෙරුන් උපත ලැබුවේ කෝලිත බමුණු ගමේය. මොග්ගලී නම් බැමිණියගේ පුත්‍රයාවූ බැවින් ඔහු මොග්ගල්ලාන නමින් ප්‍රසිද්ධ විය. රූපසාරි නම් බැමිනියගේ පුත්‍රයා සාරිපුත්ත නම් විය.

පසුව ධරම සේනාධිපති වූ සැරියුත් මාහිමියෝ ප්‍රඥාව අතින් අග තැන සිටි ශ්‍රාවකයාණෝ වූහ. සෘද්ධිවන්ත භික්ෂූන් අතර ප්‍රමුඛයා වූයේ මුගලන් තෙරුන්ය.

නවම් පුනු පොහෝදා සැරියුත් - මුගලන් දෙනමට අගසව් තනතුරු ලබාදීමෙන් අනතුරුව, මහා සංඝයාට ඕවාද ප්‍රාතිමෝක්ෂය, අප තථාගත බුදුපියාණන් වහන්සේ දේශනා කළසේක. බුද්ධ ශාසනය ප්‍රථම වසර විස්ස තුළදී ඉතා විනයගරුකව පැවැතිණි. එම නිසා එම කාලය තුළදී තමන්ගේ ගෝලයන් වූ භික්ෂූන් වහන්සේට විනය ශික්ෂාපද පැනවීමක් අවශ්‍ය නොවීය. මේ නිසා ආඥාප්‍රතිමෝක්ෂය දේශනා කරන්නට අවශ්‍යතාවක් පැන නැඟුණේ නැත. ආඥා, ප්‍රතිමෝක්ෂය අණ කිරීමක්, ලෙස හැඳින්විය හැකිය. ඕවාද ප්‍රාතිමෝක්ෂය බුදුන් වහන්සේ භික්ෂූන්ට දේශනා කොට වදාළේ, නවම් පුණු පොහෝ දිනකදීය.

සැරියුත් - මුගලන් යන අග සවු හිමිවරුන් පිරිනිවන් පෑමෙන් පසුව, ගෞතම බුදුන් වහන්සේ රජගහනුවරින් පිටත්ව ගොස් චාපාල චෛත්‍යය අබියසදී ආනන්ද හිමිපාණන් හමුව සතර ඉර්ධිපාද වැඩූ අයකුට අවශ්‍ය නම් කල්පයක් වුවද ජීවත්විය හැකි බව ප්‍රකාශ කළහ.

එහෙත් ආනන්ද හිමියන්ට බුදුරදුන් කරන ලද ඉල්ලීම පැහැදිලි නොවිණි. එබැවින් නවම් පුණු පොහෝ දිනක බුදුන් වහන්සේ ආයු සංස්කාරය අත්හළ සේක.

නවම් පුන් පොහෝ දින සිදුවූ තවත් වැදගත් සිද්ධියක් ලෙස මහා සංඝයා වෙත ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනාව සිදු කිරීම සැළකිය හැකිය. බෞද්ධ ශාසනයේ මුල් වසර 20 ක කාලය තුළදී විනය කඩ කිරීමේ සිද්ධීන් නොවූ නිසා ශික්ෂාපද පැනවීමක් සිදු නොවීය. ඒ කාලයේ ශ්‍රාවකයන්ට හික්මීම පිණිස උපයෝගී වූයේ, ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.

ආඥා ප්‍රාතිමෝක්ෂ දේශනාවක් එකල සිදු නොවීය.

තමාගේ ගැලවුම්කරුවා තමන්ම බවත්, විමුක්තිය උදාකරගත හැකිවන්නේ, තමාගේ උට්ඨාන වීර්යයෙන් බවත් එසේම විමුක්තිය, ලබා ගැනීම දෙවියන්ගේ ආධාරයෙන් කළ නොහැකි බවත්, අප අවධාරණය කළ යුතුය.

තමා අපේක්ෂා කරන විමුක්තිය, නිවන පසක් කරගත හැකි වන්නේ තමාගේම ස්වශක්තියෙන් ය. සියලු සත්ත්වයන්ට මෙත් පතුරුවා සමස්ත ලෝ වැස්සන්ට දයාව, කරුණාව, මෛත්‍රිය පැතිරවීමෙන් පමණකි ඔබට විමුක්තිය උදාකරගත හැකි වන්නේ, මෙම ප්‍රකාශය සඳහන් ඇත්තේ මහාචාර්ය එලියට් විසින් ලියන ලද බුඩිසම් ඇන්ඩ් හින්ඩුයිසම් යන ග්‍රන්ථයේය.

බොදු ඉතිහාසයේ වැදගත් සිදුවීම් රැසක් සිදු උන නවම් පුන් පෝදා ඔබත් ජීවිතයේ එක් වරදක් හෝ නිවැරදි කරගැනීමට උත්සාහ කරන්නේන්නම් ලොව්තුරු බුදුපියාණන්ට සිදුකරන ඉහලම ගෞරවය එය බව සිහි තබාගන්න.



# සක්කාය දිට්ඨිය දුරු කරමු



සෝතාපන්න ඵලයට පත් වන තෙක් සංසාර ගමනේ අනුසෝතගාමී ප්‍රවාහයෙන් නොමිදිය හැකි බැව් අපි දනිමු. සෝවාන් ඵලයට පත් වීම අප හඳුන්වන්නේ සම්මා දිට්ඨිය පහළ වීමක් වශයෙනි. එසේ සම්මා දිට්ඨිය පහළ වන්නේ කෙසේද ? සෝවාන් ඵලයට පත් වීමේදී බිඳ වැටෙන සංසාර බන්ධනත්‍රයක් ගැන අපි දනිමු. ඒවා නම්

1 සක්කාය දිට්ඨිය
2 විචිකිච්ඡාව
3 සීලබ්බත පරාමාස

මෙයින් සක්කාය දිට්ඨිය පිළිබඳ කෙටි හැඳින්වීමක් මේ දහම් ලිපියෙන් කරමු. අප සැවොම ලෙඩ වීම, මහලු වීම හා මිය යාම යනාදි පෙනෙන දුක්වලට මෙන්ම ප්‍රියයන්ගෙන් වෙන්වීම්, අප්‍රියයන් හා එක්වීම් වැනි මානසික දුක්වලට මොහොතක් මොහොතක් පාසා මුහුණ දෙන බව අපි දනිමු. ඒ සියල්ලටම හේතුව සක්කාය දිට්ඨිය නැති කර නොගැනීමයි. සක්කාය දිට්ඨිය යන්නෙහි සරල අදහස වන්නේ මම යන හැඟීම යන්නයි. එය තවදුරටත් විග්‍රහ කළහොත් සත් හා කාය යන වචනද්වය එක්ව එය තැනී ඇත. කාය යනු පංචස්කන්ධයයි. සත් යනු සාර වශයෙන් ගැනීමයි. පංචස්කන්ධයේ පැවැත්ම හොඳයි ලෙස ගන්නා විට සිදු වන්නේ කුමක්ද ? පංචස්කන්ධය නැවත නැවතත් හට ගැනීමයි. පංචස්කන්ධය නැවත නැවතත් හට ගැනීම යනු දුක දිගටම පැවතීමයි.

පංචස්කන්ධය විෂයයක බන්ධනය නැත්නම් මානසික එකතුව හෙවත් උපදානය සිදු වන්නේ ආකාර විස්සකිනි. එය රූපය ඇසුරෙන් මෙසේ විග්‍රහ කළ හැකිය.

1 රූපය යනු මමයි
2 මම හැදී ඇත්තේ රූපයෙනි
3 මම කෙරෙහි රූපය වෙයි

මෙය රූපයට පමණක් නොව වේදනාව, සංඥාව, සංඛාර හා විඤ්ඤාණ යන සියලුම ස්කන්ධ කෙරෙහි ක්‍රියාත්මක වෙයි. කෙසේ වෙතත් යම් රූපයක් වේදනාවක් සංඥාවක් සංඛාරයක් හෝ විඤ්ඤාණයක් කෙරෙහි මෙම ආකාර හතරෙන් මමත්වය ඇති වීම ඉතා සියුම්ය. එය වචනයෙන් විස්තර කළ නොහැකිය. භාවනාවෙන්ම දැකිය යුත්තකි. සමාධියක පිහිටා විදර්ශනාවට සිත නගා අවබෝධ කර ගත යුත්තකි.

කෙසේ වෙතත් මෙම අවබෝධයට අප සිත පත් කර ගන්නේ කෙසේදැයි මහාකාරුණිකයාණෝ මෙසේ දේශනා කළ සේක.

> මහණෙනි යම් ආර්ය ශ්‍රාවකයෙක් මේ පංච උපාදානස්කන්ධයන්හි සමුදයත් අස්තයත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඇති සැටියෙන් දැනගනීද මහණෙනි ඒ ආර්ය ශ්‍රාවකයා සෝතාපන්නයයි ද සසරට ආපසු නොපෙරළෙන බවද නියක වශයෙන් නිවනට යොමු වී සිටී යයිද කියනු ලැබේ.

ඒ දේශනාව අපේ ප්‍රායෝගික ජීවිතයට සතර ඉරියව්වේදීම ගළපා ගතහොත් මේ මාර්ගය ප්‍රත්‍යක්ෂ කිරීම අපහසු නොවෙයි. රූපය ගත හොත් එය සතර මහා භූත ධාතූන්ගෙන් හට ගත්තකි. වේදනා සංඥා සංඛාර තුන හට ගන්නේ ස්පර්ශයෙන් හෙවත් ඇස කන ආදී ඉන්ද්‍රියවල ක්‍රියාකාරිත්වයෙනි. විඤ්ඤාණය හට ගන්නේ නාමරූප හේතුවෙනි. ඒ ඒ හේතු නැති වීමම ඒ ඒ ස්කන්ධවල නැතිවීමම වේ. ආස්වාදය යනු මේ සම්මුති ලෝකය තුළ ඒ ඇතිව නැතිව යන මායාව නොදැකීම නිසා ඒවා තුළ විඳින්නෙක් මවා ඒ ස්කන්ධ ඇසුරු කිරීමයි. එහෙත් ඒ ආස්වාදය තුළම ඊට විපාකය වශයෙන් දුක්කඳ ලැබෙයි. නිස්සරණය යනු ඒ ඒ ස්කන්ධ ක්‍රියාකාරිත්වය යථාභූත ඥාණයෙන් දැක එයින් අතමිදීමයි. එනම් අතහැරීමයි. එසේ අත් නොහරින තාක්කල් අපි සැවොම කායිකව මානසිකව රෝගී වෙමු. එනයින් මුළු ලොවම රෝගීහුය. මේ විශ්වය රෝහලකි. නමුත් ඒ සංසාර රෝගය නිට්ටාවටම සුවපත් වූ පසු ලැබෙන අවේදයිත සුඛයද බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇති සේක.

> සද්ධර්මයෙහි හික්මුණු ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ
>
> රූපය ආත්මය යැයි හෝ ආත්මය රූප ඇත්තෙකැයි හෝ ආත්මයෙහි රූපය පවතී යැයි හෝ රූපයෙහි  ආත්මය පවතී යැයි හෝ නොදකියි. මෙසේ රූපය මමය මාගේ රූපය යැයි නොගනියි. මෙසේ රූපය මම මගේ යැයි නොගෙන සිටින ඔහුගේ රූපය වෙනස් වන විට බිඳී යන විට අන් අයුරක් වන විට ඔහුට ශෝකය දුක දොම්නස විලාප කීම් දැඩි සිත් තැවුල් නූපදියි.

සත්කාය දිට්ඨියේ ස්වභාවය මෙයින් ඔබට වැටහෙනු ඇත. සත්කාය දිට්ඨියෙන් මිදී දහම් ඇස ලබා ගැනීමට කළ යුත්තේ සෝතාපන්න මාර්ගය වැඩීමයි. කෙසේ වෙතත් සත්කාය දිට්ඨිය බිඳ වැටුණද අනුසහගත මමත්වය පුද්ගලයා තුළ පවතියි. එය සපුරා නැති වන්නේ උතුම් අර්හත්වයට පත් වීමෙනි. එය දුකෙහි නිමාවයි. ඔබ සැමට ඒ උතුම් නිවන් මගට සිත් යෙදේවා.

නාලක ජයසේන

# බොදු සමළු තොරතුරු







සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ශත සංවත්සරය නිමිත්තෙන් සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය සංවිධාන කළ ශතකාභිමානි ගෞරව ප්‍රණාම උළෙලේ දෙවැනි අදියර දකුණු පළාත  කේන්ද්‍ර කරගනිමින් මාතර සණස උත්සව ශාලාවේදී ඉකුත් දෙසැම්බර් 25 වැනි දින පැවැත්විණි.

මල්වතු මහා විහාර රෝහණ පාර්ශවයේ අනුනායක ඕමාරේ කස්සප අනුනාහිමියන්, අමරපුර ශ්‍රී ධම්මරක්ෂිත නිකායේ මහානායක තිරිකුණාමලයේ ආනන්ද මහා නාහිමියන් සහ දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝ නායක ඉත්තදෙමළියේ ඉන්දාසාර නාහිමියන්ගෙන් සමන්විත මූලාසන මණ්ඩලයක ප්‍රධානත්වයෙන්  සහ පාර්ලිමේන්තු කතානායක මහින්ද යාපා අබේවර්ධන හිටපු කතානායක චමල් රාජපක්ෂ, දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ ඇතැම් ගිහි නායකයන් රැසකගේ සහභාගිත්වයෙන් පැවති මෙම ප්‍රණාම උළෙල විශේෂාංග රැසකින් සමන්විත විය.

මෙහිදි අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සමිතිය බෞද්ධ සමිති සංවිධාන අංශයෙන් විශේෂ ඇගැයීමකට පාත්‍ර වූ අතර සම්බුද්ධ ශාසනයේ උන්නතියට කළ සේවය උදෙසා ඩබ්ලිව්. එස්. බණ්ඩාර මයතා,ඩී. බි. අබේසිංහ මහත්මිය සහ එච්. ඒ. ගුණසේකර මහත්මිය. ශාසනාභිවර්ධන කිර්ති ශ්‍රී ගෞරව නාමයෙන් පිදුම් ලැබුහ.නිස්සරණධාපාන්ෂයෙන් කාලයක් තිස්සේ දහම් ගුරු සේවය වෙනුවෙන් ගරුතර ස්වාමින් වහන්සේලා විසිනමක්, මෙහෙණින් වහන්සේලා දෙනමනමක් සහ ගුරු මහත්ම මහත්මීන් 483 දෙනෙක් ශාසනාභිමාණී ධම්මචාරිය ගෞරව නාසයෙන් පිදූම් ලැබූහ,

අපේ රටට ජාතික නිදහස ලබා ගැනිම සඳහා වු අධිරාජ්‍ය වීරෝධි සටනේ නායකයක් වූ ශ්‍රීමත් ඩී.බි. ජයතිලක මහතා ප්‍රමුක ගිහි පැවිදි නායකයන් රැසක් එකතුව් ආරම්භ කළ සමස්ත ලංකා මහා සම්මේලනයට සියවසක් පිරිම නිමිත්තෙන් ශතකාභිමානි ගෞරව ප්‍රණාම උත්සව මාලාවේ පළමුවැන්න ඉකුත් වසරේදී සම්මේලන මුලස්ථානයේදි පැවත්විණි.

බුද්ධ ශාසනයේ අභිවෘද්ධය වෙනුවෙන්  ශාසනික සේවයේ නියැලන පුද්ගලයන් ඇගැයිම ජාතික හා ප්‍රලන ප්‍රාදේශිය මට්ටමින් ස්වේඡ්ඡා  සංවිධාන ඇගැයීම දිස්ත්‍රික්ක මට්ටමින් දීරිය දහම් ගුරු සේවයේ ඇගැයිම  ජාතික හා ප්‍රාදේශිය මට්ටමින් බොදු පුවත් ප්‍රචාරණයේ යෙදි සිටින මාධ්‍යවේදින් ඇගැයිම ශතකාභිමානි සංවත්සර උත්සව මාලාවේ මූලික අරමුණ අතරවේ

ප්‍රධාන උත්සවය මේ අනුව එම උත්සව මාලාවේ බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් පැවති අතර එහිදි දහම් ගුරු  භවතුන්  බෞද්ධ සමිති සමාගම්  ස්වේඡ්ඡා  සංවිධානය ඇගයීමට ලක්වු අතර බෞද්ධ සන්නිවේදනයේ යෙදි සිටින බෞද්ධ මාධ්‍යවේදීන් දස දෙනෙකු සාසනාභිමානී මාධ්‍යවිභූෂණ ගෞරව සම්මානයෙන් පිදූම් ලැබුහ. සීසර් සුදුසිංහ මහතා මතුගම සෙනවිරුවන් මහතා,චතුර පමුණුව මහතා, ජයන්ති කූරේ මෙනවිය,සමන්ති එදිරිසිංහ මහත්මිය,එල්.බී. මුණසිංහ මහතා, ලක්ෂ්මන් වසන්ත රුක්මාල් මහතා, ජනක ජීවන්ත හෙට්ටිආරච්චි මහතා, ඒ. එම්. සංජය රශ්මින්ද ගුණරත්න මහතා සහ බුදුගල සේමරතන ස්වාමින් වහන්සේ එලෙස ගෞරව බුහුමානයට පත් වු මාධ්‍යවේදින් ය.

වසර 2500ක් තිස්සේ පැවත එන බුදු දහම ආරක්ෂා කර ලැනීම සහ පේෂණය කිරිම සඳහා සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය ශතවර්ෂයකට අධික කාලයක් තිස්සේ කැප වී සිටි. මෙම සත් කාර්යයට වර්තමානයේ උර දී සිටින උදාර බොදු නායකයන් සහ සමිති සමාගම්  ඇගැයිම්  අද යුගයේ අවශ්‍යතාවයකි. සම්මේලනයේ වත්මන් සභාපති චන්ද්‍රා නිමල් වාකිෂ්ඨ මහතාගේ උපදෙස් පරිදි ශතකාභිමාණී ගෞරව ප්‍රණාම උත්සව මාලාව සංවිධාන කෙරෙනුයේ එම උදාර අරමුණ පෙරදැරි කරගෙනය. සම්මේලනයේ සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය මෙම උත්සවය මාලාවේ බර කරටගෙන තිබේ. සම්මේලනයේ උප සභාපති හා සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලයේ සභාපති උපුල් රූපසිංහ මහතා මෙම කටයුතු වලට නායකත්වය ලබා දේ. ඉදිරියේදී රටපුරා අනෙකුත් පළාත් ආශ්‍රිතව ද පළාත් ප්‍රණාම උත්සවය සංවිධානය කෙරේ.

**දුමින්ද ගුරුගේ**

# සේවකයන්ගෙන් ඵලදායි ලෙස සේවා ලබා ගැනීම පිළිබඳ බුදු දහමේ ඉගැන්වීම් අප පිළිපදිනවාද?



වත්මන් සමාජයේ සේවකයන්ගෙන් ඵලදායි ලෙස සේවාවන් ලබා ගැනීම ඉතා අපහසු කටයුත්ත්ක බව බොහෝ දෙනා සාකච්ඡා කරන මාතෘකාවකි. පුදගලික නිවසක, කර්මාන්ත ශාලාවක, කුඩා ව්‍යාපාරයක, මෙන්ම විශාල ව්‍යාපාරයක ද ප්‍රධානින්ගෙන් තත්ත්වය කෙසේද යන්න විමසීමේ දී ප්‍රධාන ගැටළුවක් ලෙස ස දහන් කරන්නේ සේවක ප්‍රශ්නයයි.

බුදු දහම අනුව බෞද්ධ අප හට මෙය ප්‍රශ්නයක් විය නොහැක්කේ බුදුන්වහන්සේ ගිහියන්ගේ දියුණු සඳහා කරුණු 55 අන්තර්ගතව දේශනා කර ඇති සිගාලකෝවාද සූත්‍රයේ ඉතා පැහැදිලිව සේවකයන් හා සේව්‍යයන් සබඳතාවය පවත්වාගෙන යායුතු ආකාරය සඳහන් කර ඇති බැවිනි.

අතීතයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මූලධන අවශ්‍යතාවය සොයා බැලූ අතර ඉන්පසු විකුණන භාණ්ඩය හෝ සේවාව එම සේවය ලබන්නේ කවුද හෝ භාණ්ඩය මිළදී ගන්නේ කවරෙක්ද යන්න හා ඉන්පසු සේවය කරන සේවකයන්ගේ තත්ත්වය ද බලනු ලැබීය.

එහෙත් අද ව්‍යාපාරයන් ආරම්භ කිරීමේ දී ප්‍රාග්ධනය මෙන්ම ඒ සඳහා සේවකයන් ඇත්ද යන්න ප්‍රධාන වශයෙන් සොයා බලනු ලැබේ.

ගොඩනැගිලි කර්මාන්තයේ හා කුඩා ප්‍රමාණයේ හෝටල්වල මෙන්ම කෘෂිකර්මාන්තයේදී ද යොදා ගන්නා යන්ත්‍රවල ක්‍රියාකරුවන් වශයෙන් ඉන්දීය හා චීන ජාතිකයින් 12,000 වැඩි ප්‍රමාණයක් සංචාරක වීසා කාලය ඉක්මවා ලංකාවේ රැදී සිටින බව අප්‍රේල් 21 වන දින ප්‍රහාරයෙන් පසු විදේශිකයින්ගේ තොරතරු සෙවීමේදී හෙලිවී ඇත.

මෙම සොයා ගෙන ඇති 12,000 කට වඩා වැඩි විදේශිකයින් පිරිසක් ලංකාවෙහි සේවය කරනු ඇතැයි අප විශ්වාස කරමු. මෙම පිරිස ලංකාවේ සේවය කරන්නේ ඔවුන්ගේ රටවල උපයා ගත හැකි මුදලට වඩා වැඩි මුදලක් අප රටේ දී ලැබෙන නිසා විය යුතුය.

වෙන රටවල ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් ලංකාවෙන් ලැබෙන නිසා ඉහත සඳහන් කර ඇති පරිදි විදේශිකයින් ලංකාවේ සේවාවන් සඳහා පැමිණෙන්නේත් ලංකාවේ ශ්‍රම බලකාය රැකියා සොයා පිටරටවලට යන්නෙත් ඇයි ද යන්නද සොයා බැලිය යුතුය.

සේවකයන් තමා සේවය කරන ආයතනවල සේවය කිරීම සඳහා කැමැත්ත, ඇති ආයතන පිළිබඳව සෙවීම සඳහා ජාත්‍යන්තර ආයතන කරුණු සොයා බැලීම කරනු ලැබේ. එසේ සොයා බලා වාර්ෂිකව සේවකයින් ඉතා කැමැත්තෙන් සේවය නරන ආයතන නම් කරනු ලැබේ.

ලංකාවේද මෙවැනි සමීක්ෂණ වාර්ෂිකව කරනු ලබන අතර සේවකයන් සේවය කිරීම කැමැත්ත විශාල වශයෙන් ඇති ආයතන 25 වාර්ෂිකව තෝරනු ලබයි.

එම තේරීම අනුව විශාල සමාගම්, බැංකු, විශාල රක්ෂණ සමාගම් හැරුනු කොට පුද්ගලික ආයතනවලින් සේවා කිරීමට සුදුසු ආයතන ලෙස සේවකයන් තෝරා ඇත්තේ සිංහල බෞද්ධ නොවන අයට අයිතිය ඇති සමාගම් කිහිපයක් වීම සැලකිල්ලට බඳුන් කළ යුතු වේ.
යම් පුද්ගලයෙකුගේ හෝ ආයතනයක ලාභය උපරිම කර ගැනීම උදෙසා සේවකයන්ගේ සහය ඉතාමත් වැදගත්වේ. මේ පිළිබඳව සාකච්ඡා කිරීමේදී අප දන්නා අතීතයේ සාර්ථක වර්ධනයක් ඇති කර ගත් ලොව ජයගත් ව්‍යවසායකයින්ගේ කියමන්වලට අවධානය යොමු කරමු.

ජපානයේ නැෂනල් ඉලෙක්ට්‍රික් සමාගමේ නිර්මාතෘ මත්සුෂිටා මහතා ඔහුගේ සාර්ථකත්වයේ රහස කුමක්ද ඇසූවිට පිළිතුර වූයේ,

“ මා මිනිසුන් හදනවා ඔවුන් රේඩියෝ හදනවා අපි විකුණනවා සමාගමට ලාභ එනවා” යනුවෙනි.

මත්සුෂිටා මහතා හදන්නේ සේවකයන්ය ඔහු තම සේවකයන් නිර්මාණය කළ නව නිර්මාණ පිළිබඳව නිරහන්කාරව ප්‍රකාශ කර එය ඔවුන්ගේ වැඩක් බව ප්‍රකාශ කිරීම තුළින් සේවකයන් වැඩිවැඩියෙන් අළුත් නිර්මාණ කිරීමට පෙළඹී ඇත.

නූතන අලෙවිකරණ, සේවක පරිපාලනය, ලාභය වැඩි කර ගැනීම පිළිබඳව පාඨමාලාවල මෙය “ මත්සුෂිටා සිද්ධාන්තය” යනුවෙන් විශ්වවිද්‍යාලවල පවා උගන්වනු ලබන සිද්ධාන්තයක් වී ඇත.

ලෝකයේ කාර්මික විප්ලවය ඇති වී යන්ත්‍ර වලින් වැඩකටයුතු කිරීම නිසා සේවකයන්ගේ වැඩි වීමක් දක්නට ලැබුනද අද තත්ත්වය හාත්පසින්ම වෙනස් වී ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව නිසා වසර 50 කට පෙර මිනිසාගේ උපතේදී ආයු අපේක්ෂාව සාමාන්‍ය වසර 58 පමණ වුවද අද එය පුරුෂ පක්ෂයට අවුරුදු 74 හා ස්ත්‍රී පක්ෂයට 78 ලෙස වර්ධනය වී ඇති නිසා වැඩකළ නොහැකි වයසේ වර්ධනයක් ලොව පුරා දක්නට ඇත.

ඒ අතර පුංචි පවුල රත්තරන් ප්‍රතිපත්තිය ලෙස ලොව පුරා ප්‍රචලිත වූ බැවින් තරුණ ශ්‍රමයද විශාල වශයෙන් අඩු වී ඇති බැවින් අළුත් ව්‍යාපාර හා කර්මාන්ත සඳහා සේවක ඌනතාවක් ඇති වී තිබේ.

බුදුන් වහන්සේ සේවකයන්ට සැලකීම, ඒ තුළින් තෘපිත්මත් සේවා ලබා ගැනීම, මෙයට වසර 2600 කට පෙර “සිගාලකෝවාද සූත්‍රයේ” දේශනා කර ඇත.ඒ නිසා බෞද්ධයන් වූ අපට මෙය ගැටළුවක් විය නොහැකිය. නමුත් බෞද්ධයන්ට ගැටළුවක් වී ඇති මෙම ප්‍රශ්නය අන්‍යාගමිකයින්ට/ ජාතිකයින්ට ප්‍රශ්නයක් වී නැත්තේ ඔවුන් බුදුන් වහන්සේගේ දේශනාවල වදාල පරිදි සේවකයන් පිළිබඳ සැලකිල්ල දැක්වීම නිසාය.

බුදුරජාණන් වහන්සේ “සිගාලකෝවාද සූත්‍රයේ” සදිසා නමස්කාරයේ නියම අරුත පැහැදිලි කොට ඇත. දිසා සයට වැදීම යැයි බුදුරජාණන් වහන්සේ සඳහන් කරන ලද්දේ එම හය පාර්ශවයට ගෞරවානුකූලව සිත පහදාගෙන කය, වදන දෙකෙන් උපකාර කිරීම සඳහා යහපත සැලසීම කළ යුතු බවයි.

# බෞද්ධාලෝකය

එය පහත දැක්වේ
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

1. මාතා පිතා දිසා පුබ්බා - ආචාරියා දක්ඛිණා දිසා
   පුත්තදාරා දිසා පච්ඡා - මිත්තාමච්චා ච උත්තරා

2. දාසකම්මකාරා හෙට්ඨා - උද්ධං සමණබ්‍රාහ්මණා
   එතා දිසා නමස්සෙය්‍ය - අලමත්තො කුලෙ ගිහි

| | | |
|---|---|---|
| 1. | නැගෙනහිර දිශාව යනු | - මවුපිය දෙදෙනාය |
| 2. | දකුණු දිශාව යනු | - ගුරුවරුය |
| 3. | බස්නාහිර දිශාව යනු | - අඹුදරුවෝය |
| 4. | උතුරු දිශාව යනු | - හිතමිතුරෝය |
| 5. | යට දිශාව යනු | - සේවකයෝය |
| 6. | උඩ දිශාව යනු | - පැවිදි උතුමෝය |

බුදුරජාණන් වහන්සේ ගරු කළ යුතු පක්ෂයක් හැටියට කය වචන දෙකෙන් උපකාර කළ යුතු පාර්ශවයන් ඇතුළත මව්පියන්, ගුරුවරුන්, ඇඹුරුවන්, හිතමිතුරන්, පැවිදි උතුමන් අතරට සේවකයන් ද ඇතුළත් කොට තිබීමෙන් සේවකයන්ට සැලකීම පිළිබඳව වර්තමාන ඉගැන්වීම් වසර 2600 කට පෙර උන්වහන්සේ වදාල බැව් අපට ප්‍රත්‍යක්ෂ වනු ඇත.

බොහෝ සිංහල ව්‍යාපාකයින් හට බුදු දහමේ බුදුරජාණන් වහන්සේ සඳහන් කර ඇති පරිදි සේවකයන්ට සලකන්නේ නම් සේවක ප්‍රශ්න හට ගැනීම වළක්වා ගත හැකි අතර සතුටින් වැඩ කරන සේවක පිරිසක් නම් ආයතනයේ දීර්ඝ කාලයක් සේවයේ යොදවා එම සේවකයන්ටත්, ලාභය වැඩිවීමෙන් තමාටත් අවසානයේ රටටත් ප්‍රයෝජනවත් ව්‍යාපාරයක් බවට තම ආයතනය ද පත්කරවීමට හැකිවනු ඇත.

සිගාලකෝවාද සූත්‍රයේ සේවකයන් හට සේව්‍යයන් සැලසීම පිළිබඳව ද ඉතා පැහැදිලිව කරුණු සටහන් කොට ඇත.

ස්වාමිවරුන් සේවකයන් හට කළයුතු යුතුකම් පහ

1. යථාබලං කම්මන්ත - සංවිධානෙන
2. භත්ත වෙතනානුප්පදානෙන
3. ගිලානුපට්ඨානෙන
4. අච්ඡරියානං රසානං සංවිභාගෙන.
5. සමයෙ වොස්සග්ගෙන

1. ශක්තියේ - වයසේ පමණට වැඩ නියම කළ යුතුය.

2.වෙහෙස - මහන්සියේ තරමට කුලිය දිය යුතුය.

3. අසනීප වූ විට වැඩ නොකියා බෙත් - හේත්, උපස්ථාන කිරිම හෝ කරවීම කළ යුතුය.

4. රසවත් කෑමක් - බීමක් ලැබුණු කල්හි සේවකයන්හටත් දිය යුතුය.

5. ඔවුන්ගේ මඟුල් උත්සව දිනවල දී ඇඳුම් - පැළඳුම්, මිල මුදල්, ආදිය නිවාඩු දිය යුතුය.

බුදුරජාණන් වහන්සේ සඳහන් කර ඇති පරිදි සේව්‍ය- සේවක වගකීම් නිසි පරිදි සිදු කරන්නේ නම් සිංහල බෞද්ධ ව්‍යාපාරිකයින්ට සේවක ප්‍රශ්න නොවුනු ඇතැයි අප විශ්වාස කරන අතර ව්‍යාපාරිකයින් සහ කර්මාන්තකරුවන්ට ද සේවක ප්‍රශ්න නොමැති නිසා ව්‍යාපාරය දියුණුවෙන් දියුණුවට පත් කර ගැනීමට හැකිවනු ඇති බව අපගේ විශ්වාසයයි

**වසන්ත ද සිල්වා**
**ගරු සභාපති**
**ජාතික සමාජ සේවා මණ්ඩලය**
**විශ්‍රාමික නියෝජ්‍ය සාමාන්‍යාධිකාර**
**මහජන බැංකුව**



